**බිංගිරිය ප්‍රාදේශීය සභාව - 2021**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 තත්ත්වාගණනයකළ මතය

**------------------------------**

බිංගිරිය ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට බිංගිරිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය

**---------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

---

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී පරිත්‍යාග ලෙස ලැබුණු රු.810,000 වටිනාකමැති වාහන 03ක් ගිණුම්ගත නොකිරීම නිසා එම වටිනාකමින් පරිත්‍යාග ආදායම හා මෝටර් රථ සහ කරත්ත ගිණුම අඩුවෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන භාර දෙන දිනය වන විටද මෙම වාහන 03 තක්සේරු කර වටිනාකම් සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි. මෙම වාහන 03 පිළිබඳව තක්සේරුව 2022/03/01 දින සිදු කර එම වටිනාකම් 2022/04/05 දින සභාව වෙත ඉදිරිපත් කර ඇති බව දන්වමි. | සභාවට අයත් ස්ථාවර වත්කම් ගිණුම්ගත කල යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.62,593,747ක් ගිණුම් ගත නොකිරීම නිසා එම වටිනාකමින් මුද්දර ගාස්තු ආදායම හා ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුම අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු උසාවි දඩ රු.8,209,235ක් වුවත් එය මූල්‍ය ප්‍රකාශන වල රු.3,265,225ක් ලෙස දැක්වීමෙන් රු.4,944,010කින් උසාවි දඩ ආදායම හා ලැබිය යුතු උසාවි දඩ වටිනාකම අඩුවෙන් ගිණුම් වල දක්වා තිබුණි. | ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 03ක් යටතේ ණයහිමි රු.4,787,152ක් වැඩියෙන් දැක්වීම නිසා වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දී කොරෝනා වසංගතය හේතුවෙන් අයවිය යුතු ටෙන්ඩර් කුලී ආදායම් රු.1,082,221ක් හා අයවිය යුතු කඩ කුලී රු.247,447ක් ගිණුම් වලින් ඉවත් කිරීමට අනුමැතිය ලැබී ඇතත්, එය ඉවත් කිරීමට කටයුතු කර නොමැති නිසා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද, වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශණ වල දක්වා තිබුණි. | 2022 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.10,348,736 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,391,066ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් 2021 වර්ෂයේදී කාර්යාල මේස 15ක් හා පුටු 20 ක් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.2 වගන්තිය ප්‍රකාර පිරිවිතර සකස්කර සහ තාක්ෂණ ඇගයීම් කමිටු පත්කිරීමකින් තොරව අවිධිමත් ලෙස ගෙවීම් වවුචර් අංක 1152 මගින් රු.641,750 ක් ගෙවා මිලදීගෙන තිබුණි. එහිදී | අලුත්වැඩියා කර ගැනීමට කටයුතු කරමි. | මිලදී ගත් ආයතනය මගින් කඩිනමින් අලුත්වැඩියාවක් සිදුකර ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | එක් ආයතනයක් ඉදිරිපත් කර තිබූ මිල ගණන් අනුව වගකීම් කාලය වසර 2 ක් සහිත පුටුවක මිල රු.11,900 ක්වූ අතර තවත් ආයතනයක් ඉදිරිපත් කල වගකීම් කාලයක් රහිත පුටුවක මිල රු.21,850 ක වටිනාකමට පුටු 20 ක් මිලදී ගෙන තිබුණි.ඒ අනුව රු.199,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 13 දින භෞතික පරීක්ෂාවේදී පුටු කිහිපයක රෝද ගැලවී තිබූ අතර, පුටුවල අවශ්‍ය ප්‍රමාණයට උස මට්ටම සකස්කල නොහැකි අතර, ඉඳගැනීමේදී පුටු කෙමෙන් කෙමෙන් පහතට යන බවත් පුටුවල නිශ්පාදිත ආයතනය පිළිබඳ විස්තර නොමැති අතර වගකීම් කාලයක් නොමැති බැවින් එම අලුත්වැඩියාවක් සිදු කර ගැනීමට නොහැකි වී තිබුණි. | | |
| (ආ) | 2021 දෙසැම්බර් 06 දින භෞතික ගබඩා පරීක්ෂාවේදී එකතු වටිනාකම රු.132,970 ක් වූ ආයුර්වේද බෙහෙත් තොග කල් ඉකුත් වී තිබුණි. | ප්‍රාදේශීය සභාවේ ආයුර්වේදය වැසීම නිසා ගබඩාව තුළ තැන්පත් කර ඇති මුත් එම තොගය නැවත පරිහරණයට ගත නොහැක. | බෙහෙත් තොග කල් ඉකුත් වීමට ප්‍රථම භාවිතා කළ යුතු අතර කල් ඉකුත්වූ තොග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | බිංගිරිය මූකලන්හේනේ පිහිටි පැරණි පුස්තකාල ඉඩමේ දකුණු පස ඇති පර්චස් 20 ක භූමි කොටස 2021 දෙසැම්බර් 31 දින දක්වා රු.240,000 ක මුදලකට බදු වශයෙන් ලබාදී තිබුණි. එම දේපල බදුදීමේදී ටෙන්ඩර් පටිපාටිය හෝ මිල ගණන් කැඳවීමක් කර නොතිබුණ අතර, බදු අයිතිය වර්ෂයක කාලයකට ලබා දී ගිවිසුම් අත්සන්කර තිබූ නමුදු 2021 දෙසැම්බර් 13 දින විගණන භෞතික පරීක්ෂාවේදී එම ස්ථානයේ සිමෙන්තියෙන් ස්ථිර ඉදිකිරීමක් සිදුකර තිබූ බව නිරීක්ෂණය විය. අනුමැතියකින් තොරව සිදුකල මෙම අනවසර ඉදිකිරීම ඉවත්කරන ලෙස 2021 දෙසැම්බර් 18 දින දන්වා තිබුණද, එම ඉදිකිරීම ඉවත්කිරීමට හෝ සභාව විසින් බදු ගිවිසුම අත්හිටුවීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි. | බදු දී ඇති දේපළ සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |